# කියවීම

තාත්විකවාදයෙහි ද විස්තරකෙරෙන්නේ ඇත්ත ඇති සැටියෙනි. එනම් එහි ද සැබෑ ලෝකය නිරූපණය වෙයි. එහි අධියථාර්ථවාදී ලක්ෂණ නො මැත. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා තමා බටහිරින් උගත් තාත්විකවාදයට අනුව කියා ඇත්තේ තාත්වික සාහිත්‍ය කෘතිවල සැබෑවක් ලෙස පෙනෙන අන්දමින් ඒ ඒ දෑ විස්තර කළ යුතු බව ය. ඒ මහතාට කියන්නට තිබු දේ ඉන් මනාව පැහැදිලි වෙයි. ඒ මහතාට අවශ්‍ය වූයේ තාත්විකවාදී කෘතිවල මිනිසුන් සිතහගන්වන බොරු කතා, අවිශ්වාස නොකරන කතා තිබිය යුතු ය. එහෙත් ප්‍රශ්නය නම් ඇත්ත යනු කුමක් ද යන්න ය.

ඒ කුමක් වුවත් මිනිසුන් විශ්වාසකරන්නේ ඔවුන්ට විශ්වාස කළ යුතු යැයි උගන්වා ඇති දේ හෝ ඔවුන් යම් අයුරකින් සමාජයෙන් ඉගෙන පසුව උගන්වන දෙයක් විය හැකි යි, එසේත් නැතිනම් විශ්වාසකිරීමට මිනිසුන් පුරුදුකර ඇති දෙයක් විය හැකි යි. ඉඳහිට එක් අයකු විසින් මේ විශ්වාස වෙනස් කෙරෙයි. එතෙක් පැවති විශ්වාසයක් කඩා බිඳ දමා සමහරවිට වෙනත් විශ්වාසයක් ඇතිකිරීමට එහි දී කටයුතු කෙරෙයි. අහසින් යන ඉබ්බන් ගැන කී විට මෙරට ගැමීහු එයට සවන් නොදෙති. එය සැබෑවක් නොවන බව ඔවුහු දනිති. එහෙත් ජාතක පොතෙහි කතාකරන ඉබ්බන් ඇතොත් ඒ විශ්වාසකිරීම ඔවුන්ට ප්‍රශ්නයක් නො වෙයි.

සරච්චන්ද්‍ර මහතා සාහිත්‍යකරුවාගේ ලෝකය කොටස් දෙකකට බෙදී ය. ඔහු කල්පනා ලෝකය හා සැබෑ ලෝකය නමින් ලෝක දෙකක් ගැන සඳහන් කළේ ය. කල්පනා ලෝකයෙහි ඕනෑම දෙයක් සිදුවිය හැකි ය. ඒ සාහිත්‍යකරුවා නිර්මාණයකරන ලෝකයයි. එහි අද්භූත යැයි කියන කතා තිබිය හැකි ය. සැබෑ ලෝකය යනු සාහිත්‍යකරුවාගේ නිර්මාණයක් නො වෙයි. එහෙත් සාහිත්‍ය කෘතිය ද සාහිත්‍යකරුවාගේ නිර්මාණයක් වෙයි. එසේ නම් සාහිත්‍ය කෘතිය කිනම් ආකාරයේ එකක් විය යුතු ද? එහි ඇත්තේ කිනම් ලෝකයක් ද?

ඒ ප්‍රශ්නයට සරච්චන්ද්‍ර මහතාගේ පිළිතුර වූයේ සාහිත්‍යකරුවා සැබෑ ලෝකය වැනි ලෝකයක් නිර්මාණයකළ යුතු බව ය. සාහිත්‍යකරුවා යමක් නිර්මාණයකළ යුත්තේ පාඨකයා ඒ විශ්වාසකරන අයුරින් ය. සාහිත්‍ය කෘතියෙහි නිර්මාණයකෙරෙන චරිත හැසිරිය යුත්තේ පාඨකයාට ඒ පිළිබඳ අවිශ්වාසයක් ගෙන දෙන අයුරින් නොවේ යැයි සරච්චන්ද්‍ර මහතා සිතු බව පෙනෙයි. ඒ මහතා සාහිත්‍යයෙහි තාත්විකවාදය යනුවෙන් හැඳින්වූයේ එවැනි අදහස් කිහිපයකි. තාත්විකවාදයට අවශ්‍යවූයේ විශ්වාසය ගොඩනංවන සාහිත්‍ය කෘතියකි.

එහෙත් සාහිත්‍යයෙහි යථාර්ථවාදය හෝ සමාජ සත්තා යථාර්ථවාදය හෝ එසේ නො වී ය. ඒ යථාර්ථවාද පිටුපස යම් ප්‍රවාද ද විය. තාත්විකවාදයෙහි ද ප්‍රවාද නැතිවා නො වේ. එහෙත් තාත්විකවාදයෙහි දක්නට ලැබෙන්නේ සාමාන්‍ය ජනතාව අතර ඇති ප්‍රවාද ය. ඒ සාමාන්‍ය ජනයාගේ විශ්වාස විය. එහි අහසින් යන මිනිසුන් නැත. එහෙත් ගුවන්යානාවලින් යන මිනිසුන් සිටිය හැකි ය. එසේ වුව ද හිගන්නකු සාමාන්‍ය තත්වයන් යටතේ ගුවන්යානයකින් යා නො හැකි ය. තාත්විකවාදයෙහි ප්‍රවාද සංයුක්ත විය. එහි වියුක්ත ප්‍රවාද නැතුවා නො වේ. එහෙත් මිනිසුන්ට ඒ වියුක්ත ප්‍රවාදවලින් කියැවෙන දෑ ඇතැයි සිතාගැනීමට සලස්වා ඇත. උදාහරණයක් ලෙස ගුරුත්වාකර්ෂණය යනුවෙන් දෙයක් නැති වුව ද මිනිස්සු ඒ ඇතැයි සිතති.

යථාර්ථවාද එක්කෝ බටහිර ලිබරල් යථාර්ථවාදය, නැත්නම් මාක්ස් - ට්‍රොට්ස්කි යථාර්ථවාදය, එසේත් නැත්නම් ලෙනින් - ස්ටැලින් යථාර්ථවාදය විය. එසේත් නැත්නම් වෙනත් යථාර්ථවාදයක් විය හැකි ය. ඒ යථාර්ථවාද පිටුපස යම් ප්‍රවාද විය. ඒ ප්‍රවාද සාමාන්‍ය ජනයාගේ විශ්වාස නොව ඊනියා විද්‍යාඥයන්ගේ විශ්වාස විය. යථාර්ථවාදී සාහිත්‍යකරුවා විද්‍යාඥයන්ගේ ප්‍රවාද සියල්ල විද්‍යාඥයන් ප්‍රකාශකරන ආකාරයෙන් ම දැනසිටිය යුතු බවක් ඉන් නො කියැවෙයි. සාහිත්‍යකරුවා දැනගතයුතුව ඇත්තේ විද්‍යාඥයන්ගේ, විශේෂයෙන් ම සමාජ විද්‍යාඥයන්ගේ ප්‍රවාදවලින් සමාජයට කාන්දුවන ප්‍රමාණය ය.

සමාජය විකාශයවන බව සමාජ විද්‍යාඥයෝ කියති. සමාජය ස්ථිතිකව නොපවතින බව අද කාහට වුව ද වැටහෙයි. ඒ සමාජය ඉතා වේගයෙන් කාහටත් දැකගත හැකි පරිදි වෙනස්වන බැවිනි. එහෙත් අතීත සමාජය එතරම් වේගයෙන්

© Prof. Nalin De Silva

වෙනස් නොවූ බැවින් ඒ ස්ථිතික යැයි එකල යමකුට වැටහෙන්නට ඇත. සමාජය ශීඝ්‍රයෙන් වෙනස්වීමට පටන්ගත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ය. ඒ වෙනස්වීම පිළිබඳ ලිබරල්වාදී මෙන් ම විවිධ මාක්ස්වාදී ගුරුකුලවල නිර්මාණය වී ඇති ප්‍රවාද වෙයි. මේ ප්‍රවාද සමාජයට ද කාන්දු වෙයි. ඇතැම් විට ඒ කාන්දුවීම් ප්‍රවාදවල විකෘති ය. එහෙත් සාහිත්‍යකරුවාට යම් ප්‍රවාදයක් විකෘත වී ඇත් ද නැත් ද යන්න දැනගැනීමට අවශ්‍ය නැත. එසේ දැනගැනීමට නම් සාහිත්‍යකරුවා අර සමාජ විද්‍යාඥයන්ගේ මුල් කෘති කියවිය යුතු වෙයි. සාහිත්‍යකරුවාට අවශ්‍ය සමාජයට කාන්දු වන යමක් පමණ ය.

ඇතැම් සාහිත්‍යකරුවන් ඒ මුල්කෘති කියවනවා විය හැකි ය. එහෙත් බහුතරයක් සාහිත්‍යකරුවන්ට ඒ මුල්කෘති කියවීම එතරම් වැදගත් නො වෙයි. ඔවුහු සමාජයට කාන්දුවන දැනුමෙන් ඇතැම්විට විකෘති වී ලැබෙන දැනුමෙන් සෑහීමකට පත්වෙති. මෙහි දී කියවීම ගැන ද වචනයක් කිවයුතු ය. බටහිර පශ්චාත්නූතනවාදය ගැන ක්වොන්ටම් භෞතිකය, සාපේක්ෂතාවාදය ආදිය ගැන විවිධ මත අද ලංකාවේ සමාජයෙහි ඇත. කියවීම පිළිබඳ ව ද පශ්චාත්නූතනවාදී අදහසක් ඇත. මේ අදහස් සමාජය දැනගන්නේ විකෘති ආකාරයකට බව ඇතැමුන්ගේ ලිපි ලේඛනවලින් පැහැදිලි වෙයි.

ඕනෑම අයකු යමක් කියවන්නේ තමන්ට අවශ්‍ය ආකාරයට ය. දෙදෙනකු නවකතාවක් කියවා ලබාගන්නේ එකම අදහස නො වෙයි. ඒ ඒ අය නවකතාව වේවා වෙනත් යමක් කියවන්නේ තමන්ට සාපේක්ෂව ය. ඒ දැනුම පිළිබඳ කතාවේ මුල් පාඩමකි. තමන්ට සාපේක්ෂව අත්කරගන්නා දැනුම ඒ ඒ අයගේ නිර්මාණ වෙයි. සෑම දැනුමක් ම නිර්මාණයක් බව අපි නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි දී කියමු. පශ්චාත්නූතනවාදීන් ඊනියා කියවීම් යනුවෙන් සඳහන්කරන්නේ මේ සාපේක්ෂ වූ නිර්මාණ ගැන ය. සාහිත්‍ය කෘතියක් එක් එක් ආකාරයෙන් බැලූ (කියවූ) විට අපට පෙනෙන්නේ එක් එක් ආකාරයට ය. පශ්චාත්නූතනවාදීන් යැයි කියාගන්නවුන් අතර ද ඇතැම් සංකල්ප පිළිබඳ ව ඇත්තේ විවිධ අර්ථකථන බව ඉතා පැහැදිලි ය. අද කතාකෙරෙන ෆැන්ටසිය යන වචනය ගතහොත් ඒ පිළිබඳ විවිධ පුද්ගලයන්ට ඇත්තේ විවිධ අදහස් බව පෙනී යනු ඇත.

මෙයට එක් හේතුවක් නම් නොසැලකිල්ල ය. අප උඩින් පල්ලෙන් යමක් කියවුවහොත් අපට ලැබෙන්නේ වෙනම ම අදහසකි. අපි මේ ලිපි පෙළෙන් ම උදාහරණයක් ගනිමු. බටහිර සමාජ විද්‍යාඥයන්  සමාජයක දියුණුව මැනීමේ දී ඒ සමාජයේ අපරාධ සැලකිල්ලට නොගන්නා බව මේ ලිපි පෙළෙහි සඳහන් වී ඇත. සමාජයක වර්ධනය දළ ජාතික නිශ්පාදිතය, ඒක පුද්ගල ආදායම, ශක්ති පරිභෝජනය ආදී නිර්ණායක යොදාගෙන මැනෙන මුත් සමාජයක සිදුවන අපරාධ සංඛ්‍යාව, ඒ අපරාධවල කෲරත්වය ආදිය මගින් ඒ නිර්ණය නො වෙයි. බටහිරයන් ඇතැම් විට සමාජයන් ගැන කතාකිරීමේ දී, විශේෂයෙන් ම අදාළ සමාජය පිළිබඳ අයහපත් අදහසක් අත්කරදීමට උත්සාහකරද්දී, සමාජයක මානව අයිතිවාසිකම් රැකීම ආදිය කතාකරනු පෙනේනට ඇත. එහෙත් එහි දී පවා මානව අයිතිය යන්න තමන්ට වාසිදායක වන අයුරින් නිර්වචනය කෙරෙනු දැකිය හැකි ය.

සමාජ විද්‍යාඥයන්ගේ මේ අදහස් සමාජයට ද කාන්දු වී ෴ැත. සමාජය විසින් රටක් දියුණු ද නැත් ද යන්න තීරණයකෙරෙන්නේ ඒ අදාළ රටේ මිනිසුන්ට කොපමණ වාහන තිබේ ද, ඒ අයගේ නිවාසවල තත්වය කෙසේ ද, ඒ අයට රැකියා ඇත් ද, ඒ කිනම් ආකාරයක රැකියා ද ආදිය මත පදනම් වී ය. ඇතැමුන් අදාළ රටේ කතාකිරීමේ නිදහස ඇත් ද යන කරුණු ද සලකා රටක් දියුණු නැත ආදී වශයෙන් ප්‍රකාශකරනු පෙනේනට ඇත. එහෙත් රටක් දියුණු ද නැත් ද යන්න තීරණයකිරීමේ දී අදාළ රටේ  අපරාධ සංඛ්‍යාව නිර්ණායක් ලෙස ඉදිරිපත් නො කෙරෙයි.

මේ නිර්ණායක නිර්මාණයකෙරෙන්නේ බටහිරයන් විසින් බව අප අමතක නොකළ යුතු ය. ඔවුහු තම රටවල දියුණුව යම් ප්‍රමාණයකට හෝ අවතක්සේරු වන ආකාරයේ නිර්ණායක ඉදිරිපත් නො කරති. ඔවුන්ගේ රටවල මානව අයිතිවාසිකම් ඔවුන්ගේ අර්ථයෙන් උසස් තැනක ඇති බැවින් ඔවුහු රටක දියුණුව, විශේෂයෙන් ම දියුණු නැතිකම, ගැන සඳහන්කිරීමේ දී, නිර්ණායකයක් ලෙස තම අර්ථයෙන් මානව අයිතිවාසිකම් යන සංකල්පය ඉදිරිපත්කරති. මේ ලිපි පෙළෙහි මට සඳහන්කිරීමට අවශ්‍ය වූයේ ඒ කරුණ ය. එනම් රටක දියුණුව මනින නිර්ණායකවල දී අපරාධ නො සැලකෙන බව ය. එයට හේතුව දියුණුව මැනෙන නිර්ණායකවලට අපරාධ ඇතුළත්කිරීමට බටහිරයන් (බටහිර සමාජ විද්‍යාඥයන්) තීරණයකර තිබීම ය.

© Prof. Nalin De Silva

එහෙත් ඒ ලිපි උඩින් පල්ලෙන්, නැතහොත් මා ගැන පූර්ව විනිශ්චයකින් කියවන්නන්ට එය විවිධ ආකාරයෙන් පෙනී යනු ඇත. වෙනත් වචනවලින් කියන්නේ නම් ඒ කියවන තැනැත්තා හෝ තැනැත්තිය හෝ ඒ ලිපියෙන් වෙනත් ම දෙයක් නිර්මාණයකරනු ඇත. මා කියන්නේ බොරු යැයි සිතන අයකු හෝ මගේ රචනා ශෛලියට (කතා ශෛලියට) අකමැති අයකු හෝ මගේ තර්ක බිඳීමට නොහැකි ව මා බුද්ධිමය ත්‍රස්තවාදියකු ලෙස දකින අයකු හෝ වෙනත් කරුණක් නිසා හෝ රටක දියුණුව යන්න මනින නිර්ණායකවල දී අපරාධ නො සැලකෙන්නේ යැයි යන්න ඒ රටවල අපරාධ ගැන අවධානයක් නැතැයි යනුවෙන් අවබෝධකරගනු ඇත. එසේත් නැත්නම් වෙනත් ආකාරයකින් ඒ අවබෝධකරගනු ඇත. නිවන හැරෙන්නට වෙනත් ඕනෑම අවබෝධයක් යනු නිර්මාණයකි. ඉහත සඳහන් අවබෝධ ද ඒ ඒ පාඨකයාගේ නිර්මාණ මිස වෙනත් දෙයක් නො වේ. බටහිර රටවල් අපරාධ ගැන අවධානය යොමුකිරීම එකකි. රටක දියුණුව මැනීමේ දී නිර්ණායකයක් ලෙස අපරාධ සැලකීම තවත් එකකි.

ඇතැමුන්ට අනුව මේ ලිපි පෙළෙන් කියැවෙන්නේ මෙහි සඳහන් මතය පමණක් නිවැරදි බව ය. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය උඩින් පල්ලෙන් පමණක් කියවුවකුට එවැනි නිගමනයකට ඒමට හැකි ය. එහෙත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි නිවැරදි මතයක් ගැන නො කියැවෙයි. එයට අනුව සියළු දැනුම් (නිවන දැනුමක් නො වේ) සාපේක්ෂක ය ; නිර්මාණ ය. අප කතාකරන්නේ හැකිතාක් සංගත වීම ගැන ය. මේ ලිපි තමන්ට සාපේක්ෂව කියවන්න්ට, එනම් යම් යම් අදහස් නිර්මාණයකරන්නන්ට, ලිපි පෙළෙන් පිළිතුරු දීමට මම අදහස් නො කරමි. එසේ කිරීමට ගියහොත් අවශ්‍ය පරිදි ලිපි පෙළ ලිවීමට නො හැකි ය. එහෙත් යමකුට අවශ්‍ය නම් ලිපි සම්බන්ධයෙන් ප්‍රසිද්ධ සංවාදයකට ඉදිරිපතවීමට මා සූදානම් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva